**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2014**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංවිධානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංවිධානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මහා භාණ්ඩාගාරයෙන් භූ අස්ථාවරත්වයන් වැලැක්වීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු සහ නායයෑම් ස්ථාන සිතියම්ගතකරණ කටයුතු සඳහා ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු අරමුදල් වලින් අදාල කාර්යයන්ට වැය නොකර ඉතිරිව පැවති රු.7,608,061 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ආදායම සේ සලකා ගිණුම්ගත කර තිබුණි.

(ආ) සුනාමි සහ ගංවතුර ආපදාවන්ට ඔරොත්තු දෙන ආකාරයේ ආදර්ශ නිවාස 06 ක් ඉදිකර ගැනීම සඳහා ප්‍රතිලාභීන්ට ආධාර කිරීමට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.4,188,200 ක මුදල, එම වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. කෙසේවුවද මෙම ව්‍යාපෘතිය යටතේ බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතුව පැවති රු.561,456 ක මුදල, ගෙවියයුතු වියදමක් සේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ වෙනත් ආයතන වලින් ලැබී තිබුණු රු.160,207,591 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානවල රු.80,055,432 ක නායයෑම් ස්ථාන සිතියම් ගත කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබුණු පුනරාවර්තන ප්‍රදානයන්ද ඇතුළත් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර ගෙවුම් වට්නාකම ලෙස දක්වා තිබුණු රු.20,949,289 ක් වූ ශේෂය තුළ එකතුව රු.17,923,326 ක් වූ සේවක ණය සහ අත්තිකාරම් ශේෂයන්ද ඇතුළත්ව තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

භූ තාක්ෂණ ඉංජිනේරු හා පර්යේෂණ අංශය, ව්‍යාපෘති කළමනාකරණ අංශය හා නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය යටතේ කෙරීගෙන යන වැඩ වශයෙන් පෙන්වා තිබුණු රු.132,182,194 ක මුදල සම්බන්ධ ප්‍රගති වාර්තා, සහතික කළ බිල්පත් යනාදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

#### 2.2.3 ලැබිය යුතු ගිණුම්

වර්ෂ 5 ට වැඩි කාලයක සිට නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතුව පැවති රු.5,554,149 ක් හා 2010 වර්ෂය තුළදී සිදුකරන ලද නායයෑම් පර්යේෂණ කටයුතු වෙනුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ලැබියයුතු රු.6,411,229 ක මුදලක් වර්ෂ 04 ක කාලයක සිට හිඟව පැවතුණි.

**2.3 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 371( 2) | විවිධ කාර්යයන් සඳහා ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමකළ වහාම පියවිය යුතුය. කෙසේ වුවද, එම අවශ්‍යතාවයන්ට අනුකූල නොවී අවස්ථා 32 කදී ලබාගත් එකතුව රු.1,130,523 ක අත්තිකාරම් මාස 01 ක සිට මාස 5 1/2 ක් දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද කර පියවා තිබුණි.<br><br>සමාලෝචිත වර්ෂය තුළ අවස්ථාවන් 12 කදී නිලධාරීන් 10 දෙනෙකුට ලබාදී තිබුණු රු.101,850 ක අත්තිකාරම් අදාළ කාර්යය ඉටුනොකර මාස 01 ත් 02 ත් අතර කාලයක් අත රඳවාගෙන තිබුණි. එසේම අත්තිකාරමක් ලබාගෙන අදාල කාර්යය අවසන්වී නැවතත් අත්තිකාරමක් ලබා ගත යුතු වූවද, එසේම පළමු අත්තිකාරම් මුදල පියවා නොතිබියදී නැවත අත්තිකාරම් ලබාදුන් අවස්ථා 12 ක් විගණනයේදී නිරීක්ෂණය විය.<br>සැපයුම්කරුවන්ට ලබාදෙන අත්තිකාරම් මුදල ගනුදෙනු වටිනාකමින් සියයට 20 ක් නොඉක්මවිය යුතු වූවත් ගනුදෙනු වටිනාකමින් සියයට 50 ට වැඩියෙන් අත්තිකාරම් ගෙවා තිබුණු අවස්ථා 09 ක් නිරීක්ෂණය විය. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සංවිධානය සතු පරිගනක උපාංග සහ මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.62,748,371 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,227,959 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.51,520,412 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සංවිධානයේ මෙහෙයුම් වියදම් රු.5,618,367 කින් වැඩිවී තිබුණද ආදායම රු.53,482,172 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන හේතුව වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

ආපදා අවදානම අවමකරණය සහ සුරක්ෂිත නිර්මිත පරිසරයක් උදෙසා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය හා තාක්ෂණික දායකත්වය සැපයීම සංවිධානයේ ප්‍රධාන මෙහෙවර වන අතර, නායයෑම් උපද්‍රව කලාප සිතියම්ගතකරණය, නායයෑම් හානි අවම කිරීමේ ව්‍යාපෘති පවත්වාගෙන යෑම සහ නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම සංවිධානයේ මූලික කාර්යයන් වී තිබුණි. මේ සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) නායයෑම් ආපදා කලාප සිතියම්ගතකරණ ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සංවිධානය විසින් නායයෑම් අවදානම හඳුනාගැනීම, සීමා නිර්ණය කිරීම හා ඒ සම්බන්ධිත අවදානම හඳුනාගැනීම සඳහා කුරුණෑගල,මහනුවර,කෑගල්ල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල සමාලෝචිත වර්ෂය තුළදී 1:10,000 පරිමාණය යටතේ වර්ග කිලෝමීටර 2,277.5 ක සිතියම් සකස් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ග කිලෝමීටර 1,027 ක සිතියම් සකස් කර අවසන් කර නොතිබුණි.

(ii) එසේම 1:50,000 පරිමාණය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වර්ග කිලෝමීටර 1,387 ක් සිතියම් සැකසීමේ කටයුතු ඉකුත් වර්ෂයේ සිට ආරම්භකර තිබුණු නමුත් එම කටයුතු සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර නොතිබුණි. ඒ සම්බන්ධව වර්ෂය අවසානයට වූ කාර්යසාධනය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම**

සංවිධානය විසින් විගණනයට ලබාදුන් තොරතුරු අනුව, නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල සිදුකරනු ලබන කිසියම් ගොඩනැගිලි සංවර්ධන කාර්යයන් සඳහා අනුමැතිය ලබාගැනීමට පෙර ගොඩනැගිල්ල ඉදිකරනු ලබන පාර්ශවයන් විසින් නායයෑම් අවදානම් තක්සේරු කිරීමේ වාර්තාවක් ඍජුව හෝ අදාළ පළාත් පාලන ආයතන හරහා ලබාගැනීමට කටයුතු කළ යුතුය. මෙම කාර්යය සඳහා සංවිධානය විසින් දිස්ත්‍රික්ක 10 ක කාර්යාල පිහිටුවා තිබුණි. නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම සම්බන්ධයෙන් නායයෑම් හා පර්යේෂණ අංශයේ සහ දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් තොරතුරු අනුව, මෙම වාර්තා නිකුත් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ රු.25,729,474 ක ආදායමක් උපයාගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නායයෑම් අවදානම් පවතින ප්‍රදේශ ආශ්‍රිත ගම්මානවල සිදුකරනු ලබන ඉදිකිරීම් සම්බන්ධයෙන් සංවිධානය මගින් නිකුත් කරනු ලබන සහතික ලබාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ජනතාව දැනුවත්කිරීම සඳහා ග්‍රාමසේවක නිලධාරීන් ජනතාව සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පැහැදිළි කිරීම වූයේ අනවසර ඉදිකිරීම්වලට එරෙහිව පියවර ගැනීමේ නීතිමය බලයක් සංවිධානය වෙත ලැබී නොමැති හෙයින් එම කටයුතු සඳහා ඍජුව මැදිහත් වීමට සංවිධානයට නොහැකි බවයි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී අදාල සහතික නිකුත්කිරීම සඳහා ප්‍රාදේශීය සභාවලින් රු.25,729,474 ක් අයකර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,548,058 ක මුදලක් සංවිධානය වෙත ප්‍රේෂණය නොකර පැවතීමෙන් පෙනී ගොස් තිබුණේ ප්‍රාදේශීය සභාවලින් අයකරගනු ලබන මුදල් සංවිධානය වෙත ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදය විධිමත්ව ක්‍රියාත්මක වී නොතිබුණු බවයි.

(iii) නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාගැනීමේ වැඩපිළිවෙල ආරම්භ කර තිබූ 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසාන වනතෙක් ලැබී තිබුණු 38,070 ක් වූ ඉල්ලුම්පත් අතුරින් ඉල්ලුම්පත් 35,237 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණි. කෙසේ වුවද, අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණු ඉල්ලුම්පත් සම්බන්ධයෙන් සිදුකරනු ලබන ඉදිකිරීම් පිළිබඳව පසු පරීක්ෂාවන් සිදුකිරීමට ඵලදායී වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) නායයෑම් අවදානම් අවම කිරීම සම්බන්ධ කටයුතු**

(i) ගැරඬිඇල්ල නායයෑම් අවමකරණ ව්‍යාපෘතිය යටතේ අදාළ ප්‍රදේශයේ නායයෑම පිළිබඳ තර්ජනයට දැඩි ලෙස මුහුණපා තිබුණු නිවාස 50 ක් එම අවදානමෙන් මුදාගැනීම, සුන්බුන් ගලාජම වෙනත් ප්‍රදේශයකට හැරවීම සඳහා පස් පුරවා බැම්මක් ඉදිකිරීම සහ ප්‍රධාන මාර්ග කිහිපයක් නැවත තැනීම යන කටයුතු 2012 සිට 2016 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත විය. මෙම මුළු ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.93,011,363 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ නිමකිරීමට අපේක්ෂිත කාර්යයන් සම්බන්ධ ඇස්තමේන්තු වටිනාකම රු.30,000,000 ක්වූ අතර එම කටයුතු සම්බන්ධ භෞතික ප්‍රගතිය පිළිබඳ විස්තර විගණනයට ලැබී නොතිබුණි.

(ii) පැෂන්වත්ත ප්‍රදේශයේ භූ අස්ථාවරත්වය අවම කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඇස්තමේන්තු වටිනාකම රු.25,000,000 ක් වූ අතර ඒ සඳහා රු.20,000,000 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.6,676,086 ක් වියදම් කර තිබුණද, එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ විරෝධතාවයක් හේතුවෙන් එහි කටයුතු අතරමග නතරවී තිබුණි.

**(ඈ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු**

සමාලෝචිත වර්ෂය සඳහා සංවිධානයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් 19 ක් හඳුනාගෙන තිබුණු අතර මේ සඳහා භාණ්ඩාගාරය වෙතින්

රු.12,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නායයෑම් පර්යේෂණ හා පරීක්ෂා අංශය, භූ තාක්ෂණ හා ඉංජිනේරු අංශය සහ පරිසර අධ්‍යයන සහ සේවා අංශය වෙත පර්යේෂණ 08 ක් සිදුකිරීමට රු.4,880,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, එම අංශ විසින් අදාළ පර්යේෂණ කටයුතු සිදුකර නොතිබුණි.

(ii) මානව ජනාවාස සැළසුම් හා පුහුණු කිරීමේ අංශයට පර්යේෂණ කටයුතු 07 ක් සඳහා වෙන්කරන ලද රු.3,070,000 ක් වූ ප්‍රතිපාදනය ඉක්මවා රු.6,460,062 ක් වැය කර තිබුණි.

(iii) සංවර්ධන හා පර්යේෂණ කටයුතු අදාළ සැළසුමට අනුව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඒ සඳහා ලබාදී තිබුණු රු.12,000,000 ක ප්‍රතිපාදනයෙන් වර්ෂය අවසානය වන විට රු.2,700,280 ක් ඉතිරිව තිබුණි.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ දෙකකට වැඩි කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවති තනතුරු 36 කට පුද්ගලයන් බඳවා ගැනීම සඳහා සංවිධානය විසින් අයදුම්පත් කැඳවා තිබුණේ සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී බව නිරීක්ෂණය විය.

(ආ) අනුමත කාර්යය මණ්ඩල සැළැස්ම අනුව විද්‍යාඥ තනතුරු සංඛ්‍යාව 58 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට විද්‍යාඥයින් 35 දෙනෙකු පමණක් ස්ථිර සේවයේ නියුක්ත කර තිබුණි. පුරප්පාඩුව පැවති තනතුරු 23 ක් සඳහා කොන්ත්‍රාත් සහ පැවරුම් පදනම මත නිලධාරීන් 31 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ස්ථාපිත කිරීම

ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පාංශු පර්යේෂණ විද්‍යාගාරය යන ආයතන වෙත පැවරී තිබුණු කාර්යයන් ඉටුකිරීම සඳහා වූ වෙනම ආයතනයක් වශයෙන් 1993 සැප්තැම්බර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් යටතේ මෙම සංවිධානය පිහිටුවා තිබුණි. පාර්ලිමේන්තු පනතක් යටතේ විධිමත් රාජ්‍ය ආයතනයක් ලෙස සංවිධානය සංස්ථාපනයවී නොතිබීම හේතුවෙන් අවදානම් සහිත ප්‍රදේශවල සිදුකරනු ලබන ඉදිකිරීම්වලට එරෙහිව සංවිධානයට ගතහැකි නීතිමය පියවර සීමාසහිත වූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සංවිධානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, අපේක්ෂිත භෞතික කාර්යසාධනය පදනම් කර නොගෙන එය මූල්‍යමය ඉලක්ක සපුරා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ආපදා කලාප සිතියම්ගත කිරීම, නායයෑම් අවමකරණය සඳහා සිදුකරනු ලබන ඉදිකිරීම් යනාදිය සම්බන්ධ භෞතික කාර්යසාධනය ඇගැයීමට විගණනයේදී නොහැකි විය.

එසේම ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර තිබුණු කාලගුණ ශක්‍යතා වැඩසටහන සහ ඒකාබද්ධ නායයෑම් අවමකිරීමේ ව්‍යාපෘති 1 වන අදියර සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

සංවිධානයේ අභ්‍යන්තර විගණන අංශය එක් නිලධාරියෙකුගෙන් සමන්විතව තිබුණු අතර, ප්‍රධාන අංශ යටතේ ඉටුකරන ලද කාර්යයන් සම්බන්ධ ගෙවීම් හා භෞතික කාර්යසාධනය ඉටුකිරීමේ ප්‍රගතිය වැනි කරුණු සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂා කර නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛනය සඳහා වූ මූල්‍යමය ඉලක්ක පිළියෙල කිරීමේදී ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු බවත්, අයවැයගත ආදායම් සහ වියදම් ඉලක්කයන් සපුරා ගැනීමට පසු විපරම් කටයුතු සඳහා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා කටයුතු කර නොතිබුණු බව අයවැයගත සංඛ්‍යා සහ තථ්‍ය සංඛ්‍යා අතර පැවති විශාල වෙනස්කම් වලින් පැහැදිලි විය. ඒ අනුව, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

## 5.5 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

සංවිධානය විසින් ආපදා අවදානම් අවමකරණය සඳහා රටේ කඳුකර ප්‍රදේශවල නායයෑම් පිළිබඳ අධ්‍යයනයන් සිදුකරමින් ඒ හා බැඳුණු අවදානම් ප්‍රදේශවල සිතියම් සැකසීමත් සහ එම ප්‍රදේශවල සිදුකරනු ලබන ඉදිකිරීම් සම්බන්ධ නායයෑම් අවදානම් පිළිබඳ තක්සේරු වාර්තා නිකුත් කිරීමත් යන භාරදූර වගකීම උසුලයි.

නායයෑම් ආපදා කළාප සිතියම්ගත කිරීමේ වැඩසටහන් මගින් නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල පැතිරීම හඳුනාගෙන විවිධ ආයතන මගින් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය, සංවර්ධන සැළසුම් සකස් කිරීම, පූර්ව නායයෑම් නිවේදන නිකුත් කිරීම, නායයෑම් අවදානම සහිත ප්‍රදේශවල ගොඩනැගිලි සඳහා අවසර ලබාගැනීමට භාවිතා කරනු ලැබේ.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වරින්වර දැනුවත් කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැති පාලනය
(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඈ) ව්‍යාපෘති කළමනාකරණය
(ඉ) අයවැය පාලනය